**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජූලි 10 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | අක්‍රීය ජංගම ගිණුම් 03 ක රු.1,416,145 ක් වූ ශේෂයන් වර්ෂ ගණනාවක සිට ගිණුම්වලින් අත්හැරී තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම වර්ෂයේදී මේවා නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව කාරුණිකව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.7,331,790 ක මූලධන වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | මූලධන වියදම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුවේ. | කාර්යය අවසන්ව නොමැති මෙන්ම වටිනාකම නිශ්චිතව හඳුනාගත නොහැකි බැවින් ණය හිමියන් තුල වන මූලධන වියදම් ලබන වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කෙරේ. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දැරූ රු.193,311 ක් වූ නඩත්තු වියදම් අයිතම 04 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී යන්ත්‍ර හා උපකරණ රු.2,773,904 ක් සහ ලී බඩු හා සවිකිරීම් රු.501,324 ක්, ඉඩම් හා ගොඩනැගිලි ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ප්‍රාග්ධන වියදම් මඟින් ගොඩනැගිලිවල වැඩි දියුණු වීමක් හා අගය ඉහල දැමීමක් සිදුවන අතර ඒවා සවි කිරීමෙන් පසුව සංචලන වත්කමක් ලෙස හඳුනා නොගන්නා බැවින් ඒවා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර ඇති බව කාරුණිකව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (v) | ඉකුත් වර්ෂවලට අදාල රු.2,232,979 ක් වටිනා පුනරාවර්තන වියදම් සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම නඩත්තු වියදම් හා ඒ හා සමාන ප්‍රාග්ධන වියදම් මිශ්‍රව පැවතීමෙන් මෙසේ පුනරාවර්තන වියදම් ප්‍රාග්ධනිත වී ඇති අතර එය නිවැරදි කරන ලදි. |
| (vi) | වටිනාකම රු.201,305 ක් වූ විදුලිය ගබඩා අයිතම දෙකක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | ජ’නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ පරිසර බලපත්‍ර තැන්පත් රු.508,375 ක් ආදායමට ගෙන ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | තැන්පත් තුළ වූ පරිසර බලපත්‍ර රු.508,375 ක අගයක් සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කළද එය තැන්පත් වලින් නිදහස් කොට ආදායමට ගැනීමට අතපසු වී ඇත. |
| (viii) | සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම් අත්සන් නොකළ රු.79,255,057 ක් වටිනා කර්මාන්ත 16 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදනය කර තිබුණි. | ගිවිසුම් අත්සන් නොකළ කර්මාන්ත වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීම් නොකළ යුතු වේ. | 2018 වර්ෂයෙදී මූලධන වැඩසටහන් ගණනාවක් සිදු කළද පැවති ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එබැවින් එම වැඩසටහන් ණයහිමි ලෙස දක්වන ලදි. |
| (ix) | පසුගිය වර්ෂවලට අදාළ රු.80,160,359 ක් වූ මුද්දර ගාස්තු ලැබීම් සමුච්චිත අරමුදලට බැර නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව කටයුතු කළ යුතු වේ. | පෙර වර්ෂ වලට අයත් වුවද පෙර වර්ෂවල අයවැය ගත සීමාව ඉක්මවූ උසාවි දඩ හා මුද්දර ගාස්තු ප්‍රවර්තන වර්ෂයේ පරිපූරක ආදායමක් ලෙස ගෙන ඇත. ඊට හේතුව සංවර්ධන වැඩ සඳහා උපයෝජනය කිරීමේ සාධාරණ අරමුණක් මත ප්‍රවර්තන වර්ෂයට ගලපන ලදි. |

( ආ ) නො සඳ සු දූ නු ගි ණු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ගිණුම් විෂයයන් දෙකක උපලේඛන / උපයෝගී පොත් අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර නොසැසඳීම් එකතුව රු.434,057 ක් විය. | ලේඛන සහ උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | මුදල් ශේෂයේ වෙනසක් පෙන්නුම් කරන්නේ මූල්‍ය ප්‍රකාශන වලට ගලපන ලද බැංකු සැසඳුමෙහි වූ අවිනිශ්චිත ගිණුම හා අගරු චෙක්පත් වටිනාකම මුදල් පොතට නොගලපන ලද බැවිනි. |

| | | | |
|---|---|---|---|
| (ii) | ලෙජර ගිණුම, ආදායම් හා වියදම් ගිණුම සහ ප්‍රා.ස14 හා ප්‍රා.ස19 අනුව රු.26,043,740 ක් වූ අයිතම 8ක වෙනස්කම් නිරීක්ෂණය විය. | ප්‍රා.ස. 14 හා 19 වාර්තා නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශන වලට ජ'නල් සටහන් මඟින් කරන ගැලපිලි ප්‍රා.ස. වාර්තාවල නොදැක්වීමෙන් මෙවන් වෙනසක් පෙන්නුම් කෙරේ. ප්‍රා.ස. 19 යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## (ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් ජංගම වත්කම් තුල දීර්ඝ කාලයක සිට ලැබිය යුතු රු.150,098,398 ක හඳුනා නොගත් ශේෂ 07 ක් විය. | හඳුනා නොගත් ශේෂයන් කඩිනමින් හඳුනා ගැනීමට හා අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කළ යුතු වේ. | හඳුනා නොගත් ලැබිය යුතු ගිණුම් නිරවුල් කිරීම සඳහා කමිටුවක් මඟින් කටයුතු කරන ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් උපදෙස් ලබා දී ඇති අතර මේ වන විට ඊට අදාල කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| (ii) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු දෑ තුල දීර්ඝ කාලයක සිට හඳුනා නොගත් රු.23,124,936 ක විලම්භිත ශේෂයන් 04 ක් විය. තවද වර්ෂ 03 කට පෙර අවසන් වූ කර්මාන්ත 11 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.2,393,206 ක මුදලක්ද හඳුනා නොගත් අයිතම් 05 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.3,117,132 ක මුදලක්ද විය. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | හඳුනා නොගත් ගෙවිය යුතු ගිණුම නිරවුල් කිරීම සඳහා කමිටුවක් මඟින් කටයුතු කරන ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් උපදෙස් ලබා දී ඇති අතර මේ වන විට ඊට අදාල කටයුතු සිදු කෙරෙමින් පවතී. |

## (ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

----------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු වටිනාකම රු.344,962,791 ක් වූ ගිණුම් විෂයයන් 03 ට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ලේඛන හා පොත්පත් යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම හා ගොඩනැගිලි ලේඛනය 2018 වර්ෂයට යාවත්කාලීන කළ යුතුව ඇත. |

## 1.4 අනුකූල නොවීම්

-----

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යනාදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) 13 වගන්තිය | පොදු ආගමික, පුණ්‍ය කර්ම, අධ්‍යාපනික හා නිදහස් කළ යුතු දේපළ පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | පනතේ අදාළ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පොදු/ ආගමික/ අධ්‍යාපන ස්ථාන හා නිදහස් කළ යුතු දේපළ පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කිරීමට කටයුතු කරමි. |
| | (ii) 134 වගන්තිය | බල ප්‍රදේශයේ පිහිටි දියුණු ප්‍රදේශ නිශ්චිතව කලින් කලට හඳුනාගෙන නොතිබුණි. අවසන්වරට 2008 වර්ෂයේදී හඳුනාගෙන 2011 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. | නව ආදායම් ප්‍රභවයන් හඳුනාගත යුතු වේ. | බල ප්‍රදේශය අළුතෙන් සමීක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතී. |
| | (iii) 136 වගන්තිය | හිඟ වරිපනම් රු.3,632,922 ක් සහ හිඟ අක්කර බදු රු.203,213 ක් අයකරගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ වරිපනම් බදු හා කඩ කුලී අය කර පැවති හිඟය අවම කර ගැනීමටද, දීර්ඝ කාලීනව අය නොවන ශේෂ සඳහා විකල්ප (නීතිමය) පියවර ගැනීමටද කටයුතු කර ඇත. |
| | (iv) 143 වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වසර 05 කට වරක් තක්සේරු කර ඒ අනුව බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | නව තක්සේරු අනුව ආදායම් බදු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට අය කරන වරිපනම් හා නව හඳුනාගත් දේපළ සහිත ලැයිස්තුව තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. |
| | (v) 159 (1) වගන්තිය | සභාවට අයත් දේපළ කුලියට දීම තුල අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා දේපළ තහනමට ගෙන සිදුකළ යුතු ක්‍රියාමාර්ගය අනුගමනය | ලැබිය යුතු ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | වරිපනම් බදු හිඟ මුදල් අය කර ගැනීම සඳහා චංචල හා නිශ්චල දේපළ තහනමට ගෙන විකිණීමට ලේකම්වරයා විසින් මුදල් එක්රැස් |

| | | | | |
|---|---|---|---|---|
| | | කර නොතිබුණි. | | කරන අයට බලපත්‍ර ලබා දී ඇත. |
| (ආ) | <u>1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති</u> | | | |
| | අංක 5(7) රීතිය | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතු වේ. | මූල්‍ය ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් මේ වන විට සිදු කරමින් පවතී. |

**2.** **මූල්‍ය සමාලෝචනය**
**----------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**
**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.167,577,374 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වූ වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.123,568,433 ක් විය.

**2.2** **මූල්‍ය පාලනය**
**---------------**

| | <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|---|
| (අ) | එකතුව රු.1,416,145 ක්වූ බැංකු ජංගම ගිණුම් 03 ක් වර්ෂ ගණනාවක සිට අක්‍රීයව පැවතුණි. | බැංකු ගිණුම් සක්‍රීය කිරීමට කඩිනමින් පියවර ගත යුතු වේ. | දැනට ව්‍යාපෘති අවසන් වී ඇති ජංගම ගිණුම් වසා දමා අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | අංක 0001865986 දරන ජංගම ගිණුමේ 2014 දෙසැම්බර් බැංකු සැසඳුමේ සිට ඇති රු.384,602 ක අවිනිශ්චිත ගිණුම හා රු.33,955 ක අගරු චෙක්පත් සමාලෝචිත වර්ෂයේ මුදල් පොතේ ශේෂයට එකතුකර දක්වා තිබුණි. | බැංකු හා මුදල් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | මෙම අවිනිශ්චිත ගිණුම් වටිනාකමට හේතු සහිතව මුදල් ගිණුමට ගලපා ඇති අතර අගරු චෙක්පත් වටිනාකම් බැංකු සැසඳුම් ප්‍රකාශයෙන් ඉවත් කර වෙනම ගිණුමක දක්වා ඇත. එය හඳුනා නොගත් ශේෂ සමග පසුව නිරවුල් කිරීමට කටයුතු කෙරේ. |

**2.3** **ආදායම් පරිපාලනය**
**----------------------**

**2.3.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**
**----------------------------------------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2018 2017

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| වරිපනම් බදු | 15,929 | 17,025 | 18,834 | 3,765 | 11,991 | 13,029 | 9,928 | 4,867 |
| බදු කුලී | 43,075 | 40,922 | 36,951 | 3,917 | 42,894 | 69,419 | 68,235 | 4,466 |
| බලපත්‍ර ගාස්තු | 4,774 | 3,960 | 3,960 | 508 | 6,696 | 7,079 | 7,079 | - |
| වෙනත් ආදායම් | 296,159 | 289,422 | 326,755 | 191,490 | 213,131 | 242,130 | 170,998 | 170,612 |
| එකතුව | 359,937 | 351,329 | 386,500 | 199,680 | 274,712 | 331,657 | 256,240 | 179,945 |

- රැස්කල ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායමෙන් කළ එකතු කිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් කළ එකතු කිරීම් ඇතුළත්ව තිබේ.

- පරිසර තැන්පත් මුදලක් ලැබිය යුතු බලපත්‍ර ගාස්තු වල ඇතුලත්ව ඇත.

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම රුපියල් මිලියන 351.33කින් වර්ෂය තුල රුපියල් මිලියන 225.66 ක් රැස්කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය ආරම්භයේදී හිඟ ආදායම රුපියල් මිලියන 179.94 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට තවදුරටත් රුපියල් මිලියන 199.68ක් අයකර ගැනීමට තිබුණි. | හිඟ ආදායම් අය කිරීමට කඩිනම් පියවර ගත යුතු වේ. | හිඟ වරිපනම් බදු හා කඩ කුලී අය කර ගැනීමටද, දීර්ඝ කාලීනව අය නොවන ශේෂ සඳහා විකල්ප (නීතිමය) පියවර ගැනීමටද කටයුතු කරනු ලැබේ. |

### 2.3.3 වරිපනම් බදු

#### (අ) වරිපනම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන (මූල්‍ය හා පරිපාලන) රීති 153 අනුව ප්‍රා.ස. 07 වාර්තා මාසිකව පිළියෙල කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාවේ සමස්ත වරිපනම් බදු හිඟය අදාල ලේඛන අනුව රු.3,632,922 ක් වූයෙන් හිඟ එකතු කිරීම ප්‍රමාණවත් වී නොතිබුණි. | හිඟ ආදායම් අය කර ගැනීමට ප්‍රමාණවත් පියවර ගත යුතු වේ. | ප්‍රා.ස. 07 වාර්තාව කාර්තුමය වශයෙන් සකස්කොට තිබුණි. 2019 වර්ෂයේ සිට එය මාසිකව සකස් කිරීමට කටයුතු කරමි. හිඟ වරිපනම් අය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. |

#### (ආ) අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භ වන විට රු.207,765 ක් වූ හිඟ ශේෂය වර්ෂය අවසානය වන විට රු.202,213 ක් වූ අතර ප්‍රාදේශීය සභා උපකාර්යාලවල අක්කර බදු ලේඛන යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වේ. | අක්කර බදු අයවිය යුතු ඉඩම් කට්ටි කර තිබීම, දරුවන් අතර බෙදී යාම හා සමහර දේපළ හඳුනාගත නොහැකිවීම නිසා හිඟ අක්කර බදු අයකර ගැනීමට නොහැකි වී ඇත. මේවා හඳුනා ගැනීමට සමීක්ෂණයක් ආරම්භ කර ඇති බව දන්වමි. |

## 2.3.4 කුලී

-----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි බදු කුලී හා කඩ කුලී පිළිවෙලින් රු.902,479 ක් සහ රු.3,012,358 ක් වූ අතර ඒ තුල අවුරුදු 05ට වැඩි කඩ කුලී රු.2,240,988 ක් හා බදු කුලී රු.192,710 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බදු කුලී හා කඩ කුලී හිඟ මුදලින් මේ වන විට කඩ කුලී රු.386,623 ක් හා බදු කුලී රු.381,529 ක් අය කර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි ඒවා අයකර ගැනීමට හෝ අයකල නොහැකි ශේෂ සම්බන්ධව විකල්ප (නීතිමය) පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

## 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.64,992,110 ක් හා මුද්දර ගාස්තු රු.113,303,811 ක් විය. | අය විය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වේ. | උසාවි දඩ හා මුද්දර ගාස්තු හිඟ මුදල් ගෙන්වා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති අතර මේ වන විට ඒවා කොටස් වශයෙන් අය වෙමින් පවතී. |

## 2.4 අධිභාර

---------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (3) වගන්තිය ප්‍රකාරව වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව පවරන ලද අධිභාර වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.326,355 ක් අයකර ගැනීමට තිබුණි. | අයකර ගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ ප්‍රමාද වී ගෙවන සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් සඳහා අධිකරණ දඩ මුදල් සම්බන්ධ පරීක්ෂණ වාර්තාව හා එම වාර්තාවේ නිර්දේශ අනුව බස්නාහිර පළාත් සභාවට ස්ථාන මාරු වී ගොස් ඇති කළමනාකරණ සහකාර ප්‍රසන්න ජනනන්ද මහතාගෙන් අයකර ගැනිමට අදාල ලිපි ලේඛන වයඹ පළාත් පාලන කොමසාරිස්තුමා |

වෙත 2019 අප්‍රේල් 30 දිනැති ලිපිය මඟින් යවා ඇත.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව මහජනතාව වෙත පහත සේවාවන් සැපයීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | | |
| (i) ඉඩම් හා දේපළ - ප්‍රාදේශීය සභාව වෙත හෝ ප්‍රාදේශීය සභාවේ පාලනය යටතට පවරනු ලැබූ නිශ්චල දේපළ නඩත්තුව හා කළමනාකරණය.<br>(ii) පාරවල් හා මංමාවත් ශුද්ධ පවිත්‍ර කිරීම, ජල සැපයීම, බර හා වේග සීමා කිරීම් ඒවායේ බාධක, අවහිර වීම වැලැක්වීම, අධීක්ෂණය හා විධිමත් කිරීම.<br>(iii) සංචාරක වෙළෙන්දන් අධීක්ෂණය, පාලනය , ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීම.<br>((iv) සතුන් ලඟ තබා ගැනීම, කොටු කිරීම, රැක බලා ගැනීම හා ආරක්ෂා කිරීම. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙහි බොහෝ කාරණා 1990.03.02 ගැසට් නිවේදනයේ වන සම්මත අතුරු ව්‍යවස්ථා මගින් ආවරණය වන අතර ඇතැම් කාරණා සම්බන්ධව පනත මගින් පැවරී ඇති බලතල අනුව කටයුතු කෙරේ. එසේම ආවරණය නොවන කරුණු සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පැනවීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

ආ) ක්‍රියාකාරී සැලැස්ම

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් (සංවර්ධන සැලැස්ම නමින්) පිළියෙල කර තිබුණද, 2014 පෙබරවාරි 17 දිනැති PED/RED/01/04/2014/01 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 04 ඡේදයට අනුකූල නොවීය. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | මේ වන විට 2019 - 2022 දක්වා සිව් අවුරුදු සංවර්ධිත සැලැස්මක් සකස් කර ඇත. |

(ඇ) ප්‍රතිපාදන නොසැලසීම

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිළියෙල කර තිබුණු වාර්ෂික සංවර්ධන සැළැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් 163 කින් 151 ක් සඳහා පමණක් වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සැලසීම නිසා කර්තව්‍යයන් 1 2ක් ඉටුකළ නොහැකි වී තිබුණි. | අදාළ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සමහර කර්තව්‍යයන් ඉටු කිරීමේදී වියදම් දැරීමට අවශ්‍ය නොවීම, වෙනත් වැය ශීර්ෂවලින් දැරීම සිදුවූ අතර අනෙක් කර්තව්‍යයන් ඉටු කිරීමට නොහැකි විය. |

(ඈ) අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සිය වාර්ෂික සැලැස්මේ හඳුනා නොගත් කර්මාන්ත 08 ක් ඉටුකර තිබුණි. | සැලැස්මෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා ඉදිකිරීම් අත්‍යවශ්‍යතාවය අනුව ඉතා කඩිනමින් සංවර්ධන කටයුතු කෙරෙහි අවධානය යොමු කල යුතු වේ. | 2018 වර්ෂයට අදාලව අයවැය සකස් කරන විට හා වාර්ෂික සැලැස්ම සකස් කරන විට හඳුනාගත් සංවර්ධන යෝජනා අනුව අදාල ප්‍රතිපාදන වෙන් කිරීම් කරන ලදි. නමුත් 2018 අප්‍රියෙල් මාසය තුලදී මහ සභාව ස්ථාපිත කරන ලදි. ඒ අනුව සභාව පිහිටුවීමට පෙර හඳුනාගත් සංවර්ධන යෝජනා වලට අමතරව මහජන නියෝජිතයින් විසින් කඩිනමින් සිදු කල යුතු බවට හඳුනාගත් මෙවැනි සංවර්ධන යෝජනාද ඉටු කිරීමට සභාවට සිදු විය. |

**(ඉ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම** ---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සංවර්ධන සැළැස්මේ දක්වා තිබූ විවිධ කර්තව්‍යයන් 14 ක් ඉටු කිරීම සඳහා රු.17,100,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එයින් රු.2,874,737 ක මුදලක් වැය කර තිබුණි. එහෙත් අපේක්ෂිත නිමවුම් මට්ටම් අත්පත් කරගෙන නොතිබුණි. | කර්තව්‍යය ඉටු කිරීමේදී අපේක්ෂිත නිමවුම් මට්ටම කරා ළඟාවීමට කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂය තුලදී සංවර්ධන සැලැස්මෙහි දක්වා ඇති කර්තව්‍යයන් සමහරකගෙන් අපේක්ෂිත නිමවුම් මට්ටම විවිධ හේතූන් නිසා අත්පත් කර ගැනීමට නොහැකි වූ අතර, මහජන නියෝජිත ඉල්ලීම් වලට මුල්තැන දෙමින් කටයුතු කිරීමට සිදුවීම නිසා අපේක්ෂිත නිමැවුමට ලඟා වීමට නොහැකි වී ඇති බව කාරුණිකව දන්වමි. |

**(ඊ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට කර්තව්‍යයන් 26 ක් ඉටුකිරීම සඳහා රු. 21,875,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබානොගෙන අත්හැර දමා තිබුණි. | සැලසුම් ප්‍රකාරව අත්‍යවශ්‍ය කාර්යයන් පමණක් හඳුනාගැනීමට කටයුතු කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රතිපාදන සලසා තිබුණද අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගත් කර්තව්‍යයන්ද ඇත. මෙවැනි තත්ත්වයක් උද්ගත වීමට පාරිසරික දේශපාලනික හා සමාජීය කරුණු හේතු විය. |

**(උ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | වර්ග කිලෝ මීටර් 168.27 ක බල ප්‍රදේශයකින් සමන්විත ප්‍රදේශීය සභා බල ප්‍රදේශයේ කසළ එකතු කිරීම ප්‍රදේශ 05කට පමණක් සීමා කර තිබුණි. සභා බල ප්‍රදේශය තුල රෝහල් හා සායන මධ්‍යස්ථාන 17 ක් හා කර්මාන්තශාලා කලාප 03ක් පැවතියද එම ස්ථානවලින් කසළ එකතු කිරීමක් සිදුකර නොතිබුණි. | ප්‍රදේශ හා ස්ථාන සීමා කිරීමකින් තොරව කසළ එකතු කිරීමට කටයුතු සැලසුම් කළ යුතු වේ. | කසළ එකතු කිරීමේදී වෙන්නප්පුව බල ප්‍රදේශය වර්ග කිලෝමීටර් 168.27 වුවද සියළු නගර සීමාවන් ආවරණය කරමින් වෙන්නප්පුව නගරය, කිරිමැටියාන නගරය හා දංකොටුව යන නගරයන් මුල් කර ගනිමින් වරිපනම් සීමාව තුළ කසළ එකතු කරනු ලබයි. මෙම වර්ෂයේදී කර්මාන්තශාලා වල ඉල්ලීම පරිදි ගාස්තු අය කර කසළ ලබා ගැනීමට කටයුතු යොදා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභාව සතු කොම්පෝස්ට් අංගනයේ නඩත්තු කටයුතු සඳහා විශාල වියදමක් සිදුකර තිබුණද කසළ බඳු පනවා නොතිබූ හෙයින් පිරිවැය සහා ආදායමෙන් දරා තිබුණි. | කසළ බදු පැනවීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. | කසළ බැහැර කිරීමේ අවහිරතා මත මෙම වර්ෂය තුළදී කසළ ගාස්තුවක් අය කර ගැනීමට කටයුතු යොදා ඇති අතර මේ වන විට එම ගාස්තු අය කර ගැනීම සිදු කරනු ලබයි. |
| (iii) | මල අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ස්ථානයක් සභාව විසින් හඳුනාගෙන නොතිබුණු අතර ඒවා පෞද්ගලික ඉඩම් වෙත මුදාහැර තිබුණි. | සුදුසු ස්ථාන හඳුනාගැනීමට කටයුතු කළ යුතුවේ. | මළඅපද්‍රව්‍ය පිරිපහදු ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා සුදුසු භූමියක් සභාව සතුව නොමැත. සභාව මඟින් යෝජනා කර ඇති සෙන්දිරියාමුල්ල ඉඩම ලැබුණු විගස මල අපද්‍රව්‍ය පිරිපහදු ඒකකයක් ස්ථාපිත කිරිමට යෝජිතය. |

## (ඍ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව තිරසර අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සභාව දැනුවත් වී තිබුණද විධිමත් ක්‍රම වේදයක් අනුව කටයුතු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සැළසුම් සකස් කර ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. නමුත් සභාවේ ක්‍රියාකාරකම් එහි අරමුණු හා අනුගත වන බවත් ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී එම අරමුණුවලට මූල්‍ය දායකත්වයක් සභාව සිදුකර ඇති බවත් නිරීක්ෂණය විය. එනම් දිළිඳු බව නිම කිරීම, ආහාර සුරක්ෂිත බව, පෝෂණය, නිරෝගීබව, අධ්‍යාපනය, බලශක්තිය, යටිතල පහසුකම් හා කාර්මික ප්‍රවර්ධනය, පූර්ණ රැකියා නියුක්තිය හා සම්පත් පරිභෝජනය වැනි අරමුණු කෙරෙහි සභාවෙන් මූල්‍ය දායකත්වයක් දක්වා තිබුණි. | තිරසර සංවර්ධන අරමුණුවලට අදාල ක්‍රියාකාරකම් හා ඉලක්ක හා මිනුම් දර්ශක හඳුනාගෙන අදාල ඉලක්කය කරා ළඟාවීමට කටයුතු කළ යුතු වේ. | තිරසර සංවර්ධනයට ආදාළ වැඩසටහන් රාශියක් සභාව විසින් ක්‍රියාත්මක කරන අතර ඉදිරියේ දී මිනුම් දර්ශකයක් සහිතව ඒවා ඇගයීමට ද කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ_ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 8.5 වගන්තියට අනුව මාස 09ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ නොකළ එක් නිලධාරියෙක් වාර 04 ක් හා තවත් නිලධාරියෙක් වාර 02 ක් බැගින් සමාලෝචිත වර්ෂය තුල විදේශගතවී තිබුණි. නමුත් 8.1 හා 8.2 උප වගන්ති නොසළකා කටයුතු කර තිබුණි. | ආයතන සංග්‍රහයේ වගන්ති අනුව කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්ගෙන් තව දුරටත් මේ සම්බන්ධ කරුණු පැහැදිලි කරගෙන නිවාඩු අයදුම් පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 20 අනුව සභාව වෙත යම් තැනැත්තෙක් විසින් කරනු ලබන ගෙවීමක් පිළිබඳව ප්‍රථමයෙන් කටයුතු කළයුතු වන්නේ ආදායම් ලිපිකරු වුවද, වෙන්නප්පුව ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයෙන් අයකරනු ලබන ගාස්තු එකතු කිරීමේ වගකීම ක්‍රීඩාංගන භාරකරු වෙත පවරා තිබුණි. තවද ඔහු එකතු කරනු ලබන මුදල් බොහෝ දින ගණන් ප්‍රමාදවී ප්‍රධාන කාර්යාලයට භාරදී තිබුණු අතර ඔහුට 2018 දෙසැම්බර් 11 දින භාරදුන් උප කුවිතාන්සි පොත් 08 ක් 2019 පෙබරවාරි 01 දින වන විටත් ආපසු භාරදී නොතිබුණි. | අදාල රීති ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අදාල පොත්පත්, කුවිතාන්සි පොත්, මුදල් සම්බන්ධව මනා පාලනයක් හා අධීක්ෂණයක් ක්‍රියාත්මක කළ යුතු වේ. | මේ වන විට මෙම තත්ත්වය නිවැරදි කර ඇත. එසේම අදාල නිළධාරීන් ප්‍රමාද වී මුදල් බාරදීම සම්බන්ධව මූලික විමර්ශනයක් සිදුකර එහි ප්‍රතිඵල අනුව ඔවුන් වෙත දඬුවම් නියම කරනු ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

(අ) **සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධායක ශ්‍රේණියේ ආයුර්වේද වෛද්‍ය නිලධාරි තනතුරේ වසර ගණනක් තුල සේවය කරන අනියම් වෛද්‍ය නිලධාරියෙක් විය. ද්විතියික ශ්‍රේණියේ තනතුරක කාර්මික නිලධාරිවරුන් දෙදෙනෙක් අවුරුදු 03 ක සිට කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇති අතර ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු වල අනියම් සේවකයින් 51 ක් යොදවාගෙන තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය සභාව විසින් ප්‍රධාන ආයුර්වේද මධ්‍යස්ථාන තුනට අමතරව ජංගම වෛද්‍ය මධ්‍යස්ථානද පවතින බැවින් එම සේවා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අනියම් ආයුර්වේද නිලධාරියකු යොදවා ඇත. |

(ආ) **සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.30,068,400 ක් වූ සේවක ණය ශේෂය තුල ඉකුත් වර්ෂවල සේවය අතහැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගේ රු.345,575 ක ශේෂයක්ද ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 04 දෙනෙකුගේ රු.275,450 ක ශේෂයක්ද විය. | අවල ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු බදු දී ඇති කඩ කාමර 257 කින් කඩ කාමර 73 ක් සඳහා ගිවිසුම්ගත වී නොමැති වූ අතර ඉන් 62 ක්ම දංකොටුව උපකාර්යාලයට අයත් ඒවා විය. එම කඩ කාමර 62 න් රු.2,283,986 ක් හා දේපළ බදුදීම්වලින් රු.133,456 ක් අයවිය යුතු විය. | හිඟ කඩ කුලී අයකර ගත යුතු අතර ගිවිසුම්ගත වී නොමැති කඩ කාමර 73 ක් සඳහා ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතුවේ. | දංකොටුව උප කාර්යාලයේ ගිවිසුම් නොමැති කඩ කාමර 44 කි. දේපළ බදු දීම් වලින් අයවිය යුතු මුදලින් මේ වන විට රු.87,638 ක් අයකරගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දංකොටුව උපකාර්යාලයට අයත් ගිවිසුම්ගත කඩ කාමරවලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අය නොවන හිඟ ශේෂ සම්බන්ධයෙන් බදු ගිවිසුමෙහි සඳහන් වගන්ති හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව පියවර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. | මෙම කඩ කාමර වලින් අංක 10 කඩ කාමරයට අදාලව හිඟ මුදල් අයවී ඇත. මේ පිළිබඳව කඩ කාමර හිමියන් සමග සාකච්ඡා කර නිතීමය පියවර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

-----------------------------

### 3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 217 අනුව සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, පවතින ඉඩම්වල නිරවුල් ඔප්පු සභාව සතු බවට සාක්ෂි නොවීය. | ඉඩම් හා ගොඩනැගිලි සඳහා ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතුවේ. | ඉඩම්/ගොඩනැගිලි ලේඛනය පවත්වාගෙන ගොස් ඇත. ඔප්පු/ පැවරුම් නියෝග නොමැති ඉඩම් සඳහා ඔප්පු / පැවරුම් නියෝග ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. |

### 3.5.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

---------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016දී දීර්ඝකාලීනව බදු පදනමට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණු පර්චස් 30 ක් වූ බිම් කොටස වෙනුවෙන් දෙපාර්ශවය අතර බදු ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි. | කඩිනමින් බදු ගිවිසුමක් ඇති කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධව ප්‍රධාන අමාතාංශ ලේකම් තුමා සමග සාකච්ඡා කර අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට කටයුතු කරමි. |

### 3.5.3 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1991 වර්ෂයේදී රු. 4,595,663 කට මිළට ගන්නා ලද ලියාපදිංචි අංක රහිත මෝටර් ග්‍රේඩරයක් සමාලෝචිත වර්ෂය අවසාන | අදාල ලියාපදිංචි අංක ලබා ගැනීමට හා අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | වෙන්දේසි කිරීමට කටයුතු කලද මෙතෙක් මෙයට ගැනුම්කරුවෙක් ඉදිරිපත් වී නැත. ඉදිරියේදි තක්සේරුව සංශෝධන කර මෙය අලෙවි |

| | | |
|---|---|---|
| වන විටත් කම්මල්පත්තුව උප කාර්යාලයේ ගාල් කර තිබුණි. | | කිරීමට කටයුතු කරමි. |

**3.5.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගන්නා ලද පෙර පාසල්වල භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ගතකළ බවට සාක්ෂි නොවූ අතර ඉකුත් වර්ෂයේ දංකොටුව උපකාර්යාලයේ ඌනතා ලෙස දැක්වූ භාණ්ඩ 06 ක හා මහජන පුස්තකාල 09 ක රු.108,188 ක් වටිනාකමැති පොත් 566 ක් සමාලෝචිත වර්ෂයේ අස්ථානගතවී ඇතත්, ඒ සම්බන්ධව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | අදාල භාණ්ඩ ඉන්වෙන්ට්‍රිගත කිරීමට කටයුතු කළ යුතු අතර අස්ථානගත වී ඇති පොත් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අදාලව ඉන්වෙන්ට්‍රිගත නොකළ සියළුම භාණ්ඩ ලේඛන ගත කර ඉදිරිපත් කරන ලෙස ලිඛිතව දැනුවත් කර ඇති අතර අස්ථානගතවී ඇති පොත්වල වටිනාකම පුස්තකාල කාර්යය මණ්ඩලයෙන් අය කිරීමට තීරණය කරන ලදී. |

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය අනුව පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචිත වර්ෂයට මෙන්ම ඉකුත් වර්ෂ වෙනුවෙන්ද පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කළ යුතු වේ. | 2018 වර්ෂයට වැඩ සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. |

**04. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 17 දරන ප්‍රාදේශීය සඳහා පනතේ 170 වගන්තියට පටහැනිව අයවැය ලේඛනයේ නොමැති (ප්‍රාග්ධන) වැය විෂයයන් 15 ක් වෙනුවෙන් රු.17,660,432 ක ප්‍රතිපාදන මාරු කර වියදම් දරා තිබුණි. | අවශ්‍යතාවය පදනම් කරගෙන කටයුතු ක්‍රියාත්මක කල යුතුවේ. | 2018 වර්ෂයේ අයවැය ලේඛනයේ නොමැති සංවර්ධන විෂයයන් 15 වෙනුවෙන් වැය විෂයයන් මාරු කිරීම හා පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සපයා ගනිමින් සභාව විසින් හඳුනාගත් අවශ්‍යතා පදනම් කරගෙන සිදු කරන ලදී. |
| (ආ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු ලෙස ඉකුත් වර්ෂ 02 ක් වෙනුවෙන් ලැබූ රු.66,856,548 ක් හා ලැබිය යුතු රු.13,303,811 ක් වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු සකස් කර වියදම් දරා තිබුණි. | ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) | ප්‍රාග්ධන වැය විෂයයන් වන දංකොටුව එළවළු වෙළඳසැල ඉදිකිරීමට වෙන්කර තිබූ රු.4,000,000 ක මුදලක් පුනරාවර්තන වැය විෂයය වන සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා වෙනුවෙන් මාරුකර වියදම් දරා තිබුණි. | ප්‍රාග්ධන වැය විෂයයන් පුනරාවර්තන වැය විෂයයන් සඳහා මාරු නොකළ යුතු වේ. | ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් නැවත ඇති නොවීමට වගබලා ගන්නා බවත් කාරුණිකව දන්වමි. |
| (ඈ) | සභාවේ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා විෂයය අයිතම 13 ක් සඳහා රු.32,900,000 ක් වෙන්කර තිබුණද, ඉන් අයිතම 04 ක් සඳහා රු.1,829,971 ක් වියදම් කර තිබුණෙන් මුළු ප්‍රතිපාදනයෙන් ඉතිරිය සියයට 94ක් විය. | ප්‍රතිපාදන උපයෝගී කරගෙන කාර්යයන් නිමකිරීම කල යුතු වේ. | නව සභාව ස්ථාපිත වීමෙන් අනතුරුව මහජන නියෝජිතයින් විසින් කඩිනමින් සිදු කල යුතු බවට හඳුනාගත් සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට සිදු වූයෙන් මෙම සංවර්ධන කාර්යයන් ඉටු කිරීමට නොහැකි විය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අයවැයෙන් ප්‍රතිපාදනය නොකළ රු.1,350,000 ක් වටිනා ප්‍රාග්ධන වියදම අයිතම 02 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් මුදල් ලබාගෙන අදාල කර්තව්‍යය සිදුකර නොතිබුණි. | කාලීන ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුවේ . | නඩත්තු වියදම් හා වෙන්නප්පුව බස් නැවතුම්පල අසළ කඩ කාමරවල වැඩ කොටස් නිම කිරීම නඩත්තු වියදම් යටතේ කරන ලද අතර බුජ්ජම්පොළ පුස්තකාල ඉදිරිපිට විදුහල හා පාර කොන්ක්‍රීට් කිරීම සඳහා ණයහිමියන් යටතේ එම ප්‍රතිපාදන වෙන් කර ඇත. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 5(7) ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කර එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ . | භෞතික හා මූල්‍ය කටයුතු ඇගයීමක් කර අභ්‍යන්තර විගණනයක් සිදු කෙරේ. තවද සභාවට වෙනම අභ්‍යන්තර විගණන නිලධාරියෙක් ඉල්ලා ඇත. |

## 4.3 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

ඉකුත් වර්ෂවල හඳුනාගත් පහත දැක්වෙන පාඩු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | රු.75,900 ක් වටිනා ගැල්වනයිස් බට 69 ක් අස්ථානගතවීම. | පාඩු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගැල්වනයිස් බට 92ක් සඳහා මුදල් අයකර ඇති අතර බාහිර පාර්ශවයන්ට ප්‍රදේශයේ උත්සව හා ආගමික කටයුතු සඳහා නැවත භාරදීමේ එකඟතාවය මත ලබාදී ඇත. |
| (ii) | 2016 වර්ෂයේදී ආදායම් ලෙස කපා හැර ඇති රු.30,756,510 ක් සම්බන්ධයෙන් හා 2016 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.28,252,666 ක වැටුප් ප්‍රතිපූරණය අනුමැතියක්ද රහිතව ඉකුත් වර්ෂයේදී සමුච්චිත අරමුදලට කපා හැරීම. | වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් දෛනික වැටුප් ප්‍රතිපූරණය නොකරන බැවින් ගිණුම්වලින් ඉවත් කරන ලදී. |

.